වාර්ෂික වාර්තාව 2018

SLAASMB

ශ්‍රී ලංකා ප්‍රමිති හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්* විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. * (60 පිටුව බලන්න)

# පටුන


මණ්ඩලයේ සාමාජිකයින් ... 01

2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සාමාජිකයින් ... 02

මණ්ඩලයේ ආරාධිතයින් ... 05

මණ්ඩලය විසින් පත්කරන ලද අනුකාරක කමිටු ... 06

2018 සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ... 07

තාක්ෂණික කාර්ය මණ්ඩලය ... 08

ක්‍රියාකාරකම් සමාලෝචනය 2018 ... 09

2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මත කරනු ලැබූ නිරීක්ෂණ ... 16

2018 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන් සහ නිකුත්කල නියමයන් ... 18

2018 වර්ෂය තුළ විගණන පරීක්ෂණයන් හි නිරීක්ෂණ ... 20

තේමාමය පරීක්ෂණ - 2018 ... 23

කාර්යය සාධන ලකුණු පත ... 24

2018 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව ... 26

2018 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, උපකාර ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE's) ලැයිස්තුව ... 32

2018 දෙසැම්බර 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන ... 35

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම් ... 36

විගණකාධිපති වාර්තාව ... 37

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ... 45

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය ... 46

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ... 47

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ... 48

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ... 49

විගණකාධිපති වාර්තාවේ යොමුකර ඇති ගැටළුවල වර්තමාන තත්වය ... 56

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ... 60

# මණ්ඩලයේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| **ආර් ඒ ඒ ජයලත්** *FCA, BCom (Sp), MBA, MA Econ (Kansas - USA)*<br>සහකාර අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපති | |
| **ඩී එන් ආර් සිරිවර්ධන** *BA (Hons.), LLB, Attorney-at-Law*<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | නිල බලයෙන් | |
| **ඒ එන් ගුරුගේ** *BSc , B. Admin*<br>කොමසාරිස් ජනරාල් - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | නිල බලයෙන්<br>(2018 නොවැම්බර් 19 සිට) | |
| **ඩී එම් එල් අයි දිසානායක** *BSc (Sp), B. Admin*<br>කොමසාරිස් ජනරාල් - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | නිල බලයෙන්<br>(2018 නොවැම්බර් 14 දක්වා) | |
| **වී පී විජේගුණවර්ධන** *BA(Hons), MA*<br>අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් | |
| **එල් එල් එස් වික්‍රමසිංහ** *FCA, FMAAT*<br>හවුල්කරු, බී. ආර් ද සිල්වා සහ සමාගම,<br>හිටපු සභාපති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය | පත් කල සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය |
| **ඒ හේරත්** *FCA, BSc, MBA, MAFE*<br>හවුල්කරු, අර්නස්ට් සහ යංග් | පත් කල සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය |
| **ඩබ් ඩබ් ජේ සී පෙරේරා** *FCA, BSc (B.Admin), CFE*<br>හවුල්කරු, කේ පී එම් ජී,<br>සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය | පත් කල සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය |
| **එස් එන් ජයසිංහ** *FCMA(UK)*<br>සමූහ මූල්‍ය අධ්‍යක්ෂ, සිලෝන් බිස්කට් සමූහ සමාගම | පත් කල සාමාජික | එක්සත් රාජධානියේ වරලත් කලමනාකරන ගණකාධිකාරීන්ගේ ආයතනය (ශ්‍රී ලංකා අංශය) |
| **පී එල් සී පීරිස්** *FCA, Attorney-at-Law*<br>පාලන හවුල්කරු, පී එල් චේම්බර්ස් | පත් කල සාමාජික | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| **එන් සිවප්‍රගාසම් මෙනවිය** *FCA, FCMA (UK)*<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි, එයිට්කන් ස්පෙන්ස් සමාගම | පත් කල සාමාජික | ලංකා වාණිජ මණ්ඩලය |
| **ඒ ඩී වාස් ගුණසේකර** *FCA, FSCMA*<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මූල්‍ය, සීමාසහිත සම්පත් බැංකුව | පත් කල සාමාජික | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය |
| **එම් ඩී පී එල් පෙරේරා මිය** *FCA, MBA* | මණ්ඩලයේ ලේකම් | |

* ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සම්මේලනය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනෙකු 2018 වර්ෂය තුළ මණ්ඩලයට පත්කර නොතිබිණ.

# මණ්ඩලයේ සාමාජිකයින්

2018 දෙසැම්බර් 31 වෙනි දිනට



**ආර් ඒ ඒ ජයලත්**

*B Com (Sp), MBA, MA Econ, FCA*

මණ්ඩලයේ සභාපති වන ජයලත් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අන්තර් ජාතික මෙහෙයුම්, දේශීය මෙහෙයුම්, ගෙවීම් සහ බේරුම් කිරීම් සහ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානත්වය දරන සහකාර අධිපතිවරයාය. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ෂ 29 කට වඩා වැඩි කාලයක් සේවයේ නියුක්තව සිටී.



**ඩී එන් ආර් සිරිවර්ධන**

*B.A. (Hons), LLB, Attorney-at-Law*

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස කටයුතු කරන සිරිවර්ධන මහතා සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 31 කට අධික කාලයක් සේවයකර තිබේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ පාලක සභා සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරනු ලැබේ.



**ඒ නදුන් ගුරුගේ**

*BA,Bsc*

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වන ගුරුගේ මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වර්ෂ 35 කට වඩා වැඩි කාලයක් සේවය කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන අංශයේ උපාධිධරයෙක් වන අතර වාණිජවේදී උපාධියක් ලබා ගෙන තිබේ. තවද ඔහු එක්සත් රාජධානියේ ග්‍රිනිච් ව්‍යාපාර සහ මූල්‍ය විද්‍යාලයෙන් උපායමාර්ගික කළමනාකරණය සහ නායකත්වය පිළිඹඳ ඩිප්ලෝමා පාඨමාලාව සහ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ ඉංග්‍රීසි වෘත්තිකයන් සඳහාවූ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇත. ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී වරුන්ගේ සංගමයේ (APFASL) අධි සාමාජිකයෙකි.



**වී පී විජේගුණවර්ධන**

*BA(Hons), MA(Economics)*

විජේගුණවර්ධන මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ. ඔහු ලන්ඩන් සුරැකුම්පත් හා ආයෝජන ආයතනයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපල සුදුසුකමක් ලබා තිබේ. ඔහු වසර 11 කට අධික කාලයක් ආයෝජන විශ්ලේෂණයේ සහ අරමුදල් කළමණාකරණයේ යෙදී ඇති අතර ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය හා ප්‍රතිසංවිධාන සම්බන්ධ මූලාරම්භයන් වලදී ද ඔහු නායකත්වය ලබා දී තිබේ.

# මණ්ඩලයේ සාමාජිකයින්

2018 දෙසැම්බර් 31 වෙනි දිනට



**එල් එල් එස් වික්‍රමසිංහ** *FCA, FMAAT*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආසන්නතම හිටපු සභාපතිවරයා වන වික්‍රමසිංහ මහතා බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවෙකු වශයෙන් කටයුතු කරන අතර, විගණනය, සහතික කිරීමේ සේවා, ව්‍යවහාර විගණන කටයුතු සහ බදුකරණය පිළිබඳව වර්ෂ 21 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත.

ඔහු ආසියා සහ පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) පාලක මණ්ඩල සාමාජිකයෙක් සහ එම සංගමයේම යහපාලන සහ විගණන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි. තවද ඔහු අන්තර්ජාතික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (IFAC) සුළු හා මධ්‍යම පරිමාණ වෘත්තිකයින්ගේ කමිටුවේ සභාපති වශයෙන්ද කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.



**ඒ හේරත්** *BSc. MBA, MAFE, FCA*

මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු වන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයකු ද වේ. ඔහු ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ (IFAC) වෘත්තීය ගණකාධිකරණ සංවිධාන සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු හා ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සාමාජිකයෙකු වේ. ඔහු බොහෝ සංස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂකධුර දරන අතර නියාමන ආයතන හා ව්‍යවස්ථාපිත කමිටුවල සාමාජිකයකු ලෙසත් සේවය කරයි.



**ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා** *B.sc(B.Admin.), FCA, CFE*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වන පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වේ. ඔහු දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) වෘත්තීය ආචාරධර්ම සහ ස්වාධීනතා කමිටුවේ හා සුළු හා මධ්‍ය පරිමාණ වෘත්තීය කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) රාජ්‍ය අංශ මූල්‍ය කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කරයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමයේ සහතිකලත් වංචා විමර්ශකයකු ද වේ.



**එස් එන් ජයසිංහ** *FCMA (UK)*

මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 28 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇති එස්. එන්. ජයසිංහ මහතා සිලෝන් බිස්කට් සමූහ සමාගමේ සමූහ අධ්‍යක්ෂ - මූල්‍ය ලෙස සේවය කරයි. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) ගෝලීය මණ්ඩලයේ වසර තුනක කාලයක් සේවයකර ඇති අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාවේ හිටපු සභාපතිවරයෙකු ද වේ. ඔහු ශ්‍රී ලංකා කර්මාන්ත සංගමයේ වර්තමාන සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන කමිටුවේ ද සේවය කරයි.

# මණ්ඩලයේ සාමාජිකයින්

2018 දෙසැම්බර් 31 වෙනි දිනට



**පී එල් සී පීරිස්** *FCA, Attorney-at-Law*

පීරිස් මහතා පී එල් සී චේම්බර්ස් ආයතනයේ පාලන හවුල්කරු වන අතර, ආයෝජන බැංකුකරණය, මූල්‍ය හා නීතිය පිළිබඳව වසර 23 කට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇත. නීතිය හා මූල්‍ය පිළිබඳ වෘතිකයෙකු වන ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අවසන් පරීක්ෂණය සමත් වී ඇත. දැනට ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීතිඥ සභාවේ නියෝජිත සාමාජිකයකු ද වේ.



**එන් සිවප්‍රගාසම් මෙනවිය** *FCA, FCMA (UK)*

සිවප්‍රගාසම් මෙනවිය එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස කටයුතු කරන අතර එම සමාගම් සමූහයේ සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද සේවය කරයි. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මූල්‍ය වාර්තාකරණ පීඨයේ සභාපතිනිය වන අතර ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සහ වෙනත් බොහෝ නියාමන ආයතන හා කමිටුවල සාමාජිකාවක ලෙස ද කටයුතු කරයි.



**ඒ ඩී වාස් ගුණසේකර** *FCA, FSCMA*

ගුණසේකර මහතා සම්පත් බැංකුවේ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස කටයුතු කරයි. ඔහු වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව වසර 24 කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇති අතර මෙයින් වසර 19 ක කාලයක් රක්ෂණ හා බැංකු අංශයන් හි ජ්‍යේෂ්ඨ සංස්ථාපිත කළමනාකරණ මට්ටමේ සේවය කර ඇත.

මීට පෙර ඔහු හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, එච් එන් බී ඇෂුවරන්ස් පොදු සමාගමේ සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සංස්ථාපිත සේවා), එෂියන් එලායාන්ස් රක්ෂණ සමාගමේ මූල්‍ය කළමනාකරු සහ ෆින්ලේස් පොදු සමාගමේ ගණකාධිකාරී ලෙස ද සේවය කර ඇත.

**මණ්ඩලයේ නිරීක්ෂක -**
**භාණ්ඩාගාර නියෝජිත**



**එම් ආර් වී ආර් මීපුර**

*MBS, Bsc HRM, ACA*

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන මීපුර මහතා රාජ්‍ය අංශයේ වසර 20 කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇත. ඔහු හලාවත වැවිලි සමාගමේ හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද ක්‍රියා කරයි.

# මණ්ඩලයේ ආරාධිතයින්

2018 දෙසැම්බර් 31 වෙනි දිනට

### සභාපති - ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුව



**ටී ජේ එස් රාජකාරිය**

*FCA, FCMA, FCCA*

රාජකාරිය මහතා කේපීඑම්ජී විගණන සමාගමේ හවුල්කරුවෙකු වන අතර පොදු ගිණුම්කරණ පරිචයෙහි වර්ෂ 31 කට අධික කාලයක් සේවයේ යෙදී සිටියි. ඔහු වර්තමානයේ කේපීඑම්ජී ආයතනයේ විගණන පරිචයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. තවද ඔහු කේපීඑම්ජී ආයතනයේ විගණනයන්හි තත්ත්ව සහතිකවීම් සහ තොරතුරු අවදානම් කළමනාකරණය පිළිබඳව වගකීමද දරයි.

රාජකාරිය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ කමිටු සහ පීඨ කිහිපියක සේවය කරමින් එහි ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ දී සහ මගපෙන්වීම ලබාදීමේදී ක්‍රියාකාරීව සහභාගවී ඇත.

### සභාපති - ව්‍යවස්ථාපිත ගිණුම් ප්‍රමිති කමිටුව



**එච් එම් ඒ ජයසිංහ**

*FCA, FCMA, CIPFA*

ජයසිංහ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උප සභාපතිවරයා වන අතර, අර්නස්ට් සහ යංග් සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු ද වේ. ඔහු අර්නස්ට් සහ යංග් සමාගමේ සහතික කිරීමේ සේවා සහ වෘත්තීය පරිචය ප්‍රධානියා ද බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිචය භාර අධ්‍යක්‍ෂක වරයා ද වේ.

ජයසිංහ මහතා ගිණුම්කරණය සහ විගණනය පිළිබඳව අවුරුදු 36 කට අධික කාලයක  පුළුල් පළපුරුද්දක් ලබාගෙන ඇති අතර, අන්තර්ජාතික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (IFAC) අන්තර්ජාතික අධ්‍යාපන ප්‍රමිත මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.

### අධ්‍යක්ෂ ජනරාල්



**ඩබ්ලිව් ජේ කේ ගීගනගේ**

*B Com(Sp), FCA, CIPPCA*

අධ්‍යක්‍ෂ ජනරාල් වන ගීගනගේ මෙනෙවියට පිලිවෙලින් වරලත් ගණකාධිකාරී ආයතනයක සහ රාජ්‍ය අංශයේ ප්‍රමුඛ සංවිධානවල විගණනය, මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණය යන ක්‍ෂෙත්‍රවල වසර 37 කට අධික කාලයක පලපුරුද්දක් ඇත. ඇය ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ (AAT) පාලක සභාවේ සහ ප්‍රධාන පෙලේ රාජ්‍ය වාණිජ ආයතනයක පරිපාලිත සමාගම් හා ආයෝජිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ යාවජීව සාමාජිකාවක් ද වේ.

# මණ්ඩලය විසින් පත්කරන ලද අනුකාරක කමිටු

**විගණන කමිටුව**

එල් එල් එස් වික්‍රමසිංහ - සභාපති
එන් සිවප්‍රගාසම් මෙනවිය - සාමාජික
එම් ආර් වී ආර් මීපුර - සාමාජික

**පාරිශ්‍රමික කමිටුව**

ආර් ඒ ඒ ජයලත් - සභාපති
එස් එන් ජයසිංහ - සාමාජික
එම් ආර් වී මීපුර - සාමාජික

**තාක්ෂණික අනුකාරක කමිටුව**

එන් සිවප්‍රගාසම් මෙනෙවිය - සභාපතිනිය
එච් එම් ඒ ජයසිංහ - සාමාජික
එස් එන් ජයසිංහ - සාමාජික
ඒ ඩී වාස් ගුණසේකර - සාමාජික

**තොරතුරු තාක්ෂණ අනුකාරක කමිටුව**

ආර් ඒ ඒ ජයලත් - සභාපති
ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා - සාමාජික
ඒ හේරත් - සාමාජික
එස් එන් ජයසිංහ - සාමාජික

# 2018 සේවයේ නියුතු කාර්ය මණ්ඩලය






1. ආශා අහමත් මිය
2. අනූෂා අයි මොහොට්ටි මිය
3. වසන්තා ජේ කේ ගීගනගේ මෙනෙවිය
4. ගයනි එල් පෙරේරා මිය
5. පී. එස්. බී. ඒකනායක
6. එම් සුරනි ටී. ප්‍රනාන්දු මෙනෙවිය
7. ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
8. ඉෂාරි මනුෂ්කා සිල්වා මෙනෙවිය
9. මොනිටා එන් බණ්ඩාර මිය
10. මහේෂා ලක්මාලි හේවගේ මෙනෙවිය
11. හර්ෂා බානු රසාක් මෙනෙවිය
12. දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය
13. රන්දිමා ද සිල්වා මිය
14. ලලනී වත්සලා මල්ලවාරච්චි මිය
15. කේ. රසික එස්. බණ්ඩාර
16. එෆ්. ශිරෝමි අබේකෝන් මිය
17. ආර්. ඒ. නදීශානි මනෝදිකා මිය
18. එච්. එස්. යු. පී. ජයවර්ධන
19. ඩී එම් නිලන්ති දන්දෙනි මිය
20. ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය
21. කලණි හෙට්ටිආරච්චි මිය

# තාක්ෂණික කාර්ය මණ්ඩලය

**වසන්තා ජේ කේ ගීගනගේ මෙනෙවිය**
*FCA, B.Com(Sp) CIPPCA*
අධ්‍යක්ෂ ජනරාල්

**අනූෂා අයි මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), FCMA, CGMA, CPA (Aus), BBA (Hons,), MBA (Leicester)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**ගයනි එල් පෙරේරා මිය**
*FCA, MBA (Finance)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**ආශා අහමත් මිය**
*FCA*
අධ්‍යක්ෂ තාක්ෂණික

**මොනිටා එන් බණ්ඩාර මිය**
*FCA, ACA (E&W), BB Mgt (Acc) Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**හර්සා බානු රසාක් මෙනෙවිය**
*FCA, ACMA (UK), CGMA, MBA (Sri.J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.), MBS(Col)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**මහේෂා ලක්මාලි හේවගේ මෙනෙවිය**
*FCA, ACMA(UK), CGMA, MBA (Sri.J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඉමල්කා ඉද්දමල්ගොඩ මිය**
*ACA, B.Sc (Fin) Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**කලණි හෙට්ටිආරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**රන්දිමා ද සිල්වා මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ඉෂාරි මනුෂ්කා සිල්වා මෙනෙවිය**
*FCA, BBA (Acc) Sp (Hons.), MBA (Sri.J)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩී එම් නිලන්ති දන්දෙනි මිය**
*FCA, BBA (Acc) Sp (Hons.), AIB(SL)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ලලනී වත්සලා මල්ලවාරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

## 1 හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ 1997 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. පනතේ නියම කර ඇති නිර්වචන සහ නිර්ණායක මත පදනම්ව, ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (SBE - නිර්වචනය සඳහා 60 පිටුව බලන්න.) වශයෙන් හඳුනාගෙන ඇත. මෙම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලතාව දැක්විය යුතුවන අතර නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලතාව දැකවිය යුතුවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයට සමීක්ෂණ කිරීමට හැකිවන පරිදි විගණනය කරන ලද තම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විසින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව පනතින් නියම කර ඇත. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණන කටයුතු පරීක්ෂා කිරීම, ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ ඒවායේ විගණකවරුන් විසින් ප්‍රමිතවලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් උචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම හරහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සිය කාර්යයන් කරගෙන යයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත, පනත යටතේ පැනවීම හෝ භාවිතයට ගැනීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරනු ලබේ. එවැනි ප්‍රමිති භාවිතයට ගැනීමේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ සහයවීමට ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් පනත යටතේ ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය (IASB) විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත (IAS) සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) පාදකව ගිණුම්කරණ ප්‍රමිත භාවිතයට ගනී. එමෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් භාවිතයට ගනු ලබන විගණන ප්‍රමිත, අන්තර්ජාතික විගණන සහ තහවුරු ප්‍රමිත මණ්ඩලය (IAASB) විසින් සංවර්ධනය කරන ලද අන්තර්ජාතික විගණන ප්‍රමිත මත පාදකවේ. වර්තමානයේදී, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් අනුකූලතාවය දැක්විය යුතු විගණන ප්‍රමිත 38 ක් සහ ගිණුම්කරණ ප්‍රමිත 42 ක් ආයතනය විසින් භාවිතයට ගෙන ඇත. සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටුකිරීම සඳහා, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහතින් දැක්වේ.

## 2 මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

### 2.1 සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න තහවුරු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරගෙන යනු ලැබේ. අනුකූලතාවය නොදැක්වීම සම්බන්ධයෙන් අවශ්‍යකරන පියවර, අනුකූලතාවය නොදැක්වීමේ ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව තීරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය හඳුනාගැනීම් සහ මිනුම්කරණය සහ අනාවරණයන් හා ඉදිරිපත් කිරීමට අදාල අනුකූලතාවය නොදැක්වීම සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් යොමුව ඇත. ප්‍රමිතවලට ප්‍රමාණාත්මක අනුකූලතාවය නොදැක්වීමට අදාළව සැලකිල්ල දැක්විය යුතු තරම් වූ හේතුවක් නිරීක්ෂණය නොවන අවස්ථාවකදී එබඳු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල මූල්‍ය වාර්තා ලෙස සැලකේ. මූල්‍ය ප්‍රකාශනවල, ප්‍රමාණාත්මක වුවත් ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන මතගැටීමක් හඳුනාගනු ලැබූ විට, එවැනි මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණ සහිතව අනුකූල වූ ඒවා ලෙස සලකනු ලබන අතර, ඒ පිළිබඳ සොයාගැනීම්, අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය වෙත උපකාරක ලිපියක ස්වභාවයෙන් දැනුම් දෙනු ලැබේ. ප්‍රමිතිවලින් බැහැර වීම්, මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණාත්මක ලෙස වෙනස්කරන්නේ නම්, ඊළඟට නිකුත් කිරීමට නියමිත මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලබන බවට එකඟත්වයක් එවැනි නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් ගෙන් ලබාගනු ලැබේ. බැහැරවීම් ව්‍යවස්ථාපිත විධිවිධාන උල්ලංඝනය කරනවිට, එම උල්ලංඝන බරපතල ස්වභාවයක් නොගන්නේනම්, ඒ සම්බන්ධව මණ්ඩලය විසින් විධානයන් නිකුත්කරනු ලැබේ. කෙසේවෙතත්, එවැනි බැහැරවීමක් මූල්‍ය ප්‍රකාශන නොමඟ යවන සුළු තත්වයට පත්කරන්නේ නම් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනයේ වැදගත් අවස්ථා

2018 දෙසැම්බර් 31 දින වන විට, 1995 අංක 15 දරන පනතින් නියමකර ඇති නිර්මාපකය යටතට වැටෙන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සේ හැඳින්වෙන අධීක්ෂණය කළ යුතු අස්ථිත්වයන් 1579 ක් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය හඳුනාගෙන ඇත. වර්ෂය තුළ දී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 1,456 ක් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,566 ක් ඉදිරිපත් කර තිබූ අතර, ඒවායින්

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

සමහරක් මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂ හා අදාළ වේ.

2016 වර්ෂයේදී විදේශීය උපදේශකයෙකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත මණ්ඩලයේ කාර්යමණ්ඩලය වෙත ලබාදුන් විස්තීර්ණ පුහුණුවේ ප්‍රතිඵලයක් ලෙස, අභිකුත් විගණන නියාමකයින් භාවිතා කරනු ලබන ගෝලීය පරිචයන්ට ගැලපෙන සේ, විගණන පරීක්ෂණ ප්‍රවේශය වෙනස් කරන ලදී. මෙම ප්‍රවේශය යටතේ, විගණනයන් හි ඉතා ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රයන් හඳුනාගැනීමෙන් පරීක්ෂණය ආරම්භ කර එවැනි ඉතා ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රයන් ගැඹුරින් පරීක්ෂණය කරගෙනයනු ලැබේ. විගණනයන් කරගෙනයාමේදී විගණන ප්‍රමිති වලින් බැහැරවීම් හඳුනාගැනීමට හැකියාව ලැබීම මෙම නව ප්‍රවේශයේ ප්‍රතිඵලයකි. කෙසේ වෙතත්, එවැනි පරීක්ෂණ සමාප්ත කිරීම සඳහා ආසන්න වශයෙන් දින 4-5 ක කාලයක් ගතවේ. 2013 වසරේ සිට සමාලෝචනයේ නියුක්ත කාර්යමණ්ඩල මුළු සංඛ්‍යාව ස්ථතිකව පැවති හෙයින්, විගණන ගුණාත්මකභාවය උසස් කිරීමේ අරමුණ ඇතිව විගණන පරීක්ෂණ සඳහා වැඩි කාලයක් ගතකල නිසා, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා ඇති කාලය අඩුවිය. ගුණාත්මක විගණනය මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පිළිබඳ අවදනම අඩුකරන හෙයින්, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් තෝරාගැනීමේදී ඉහල අවදනම් සහිත අස්ථිත්වයන් වාර්ෂිකව සමාලෝචනය කිරීම කෙරෙහි අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම චක්‍රීය පදනමක් මත ආවරණය කරන අතරතුරදීය.

තවදුරටත්, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 2018 පෙබරවාරියේදී, කොළඹදී පැවති IFIAR සමීක්ෂණ වැඩමුළුවේ සත්කාරකරු වීම නිසා වැඩමුළුවට සම්බන්ධ කටයුතු කරගෙන යාමට කාර්යමණ්ඩලය නියුක්ත විය. මෙම කරුණු නිසා, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය වසර තුලදී අනෙකුත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් ගෙන් කොටසක් සමග සියළුම නියාමනයට ලක්වන අස්ථිත්වයන් සමාලෝචනය කලේය. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය අනෙකුත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් වසර 3-5 කාලපරිච්ඡේදයකදී සමාලෝචනය කිරීමට සැලසුම් කරයි. ඉහල අවදනම් සහිත ආර්ථික වශයෙන් වැදගත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ අනුකූලතා මට්ටම උසස් කිරීමේ අරමුණ ඇතිව ඉහල අවදනම් සහිත නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය යොමුව ඇත.

වෙනස්වූ පරීක්ෂණ ප්‍රවේශයේ ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය තුළදී සැළසුම් කර තිබූ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන කට්ටල 625 හා සංසන්දනාත්මකව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 608 ක මූල්‍ය ප්‍රකාශන කට්ටල 638 ක් සමාලෝචනය සම්පූර්ණ කෙරිණ. නව ප්‍රවේශය භාවිතයට ගත් වර්ෂය වන 2017 තුළදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 459 ක මූල්‍ය ප්‍රකාශන කට්ටල 518 ක් සමාලෝචනය කලේය.

**2018 තුළදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයාගැනීම් අංශ අනුව**



# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

## 2.3 නව සමාලෝචන ක්‍රමවේදය යටතේ මණ්ඩලයේ කාර්යසාධන දත්තයන්

| | අයිතමය | පෙර පැවති සමාලෝචන ක්‍රමවේදය යටතේ කාර්යසාධනය | | | නව සමාලෝචන ක්‍රමවේදය යටතේ කාර්යසාධනය | |
|---|---|---|---|---|---|---|
| | **වර්ෂය** | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
| **1** | **හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)** | 1,353 | 1,140 | 1,485 | 1,559 | **1,579** |
| **2** | **ලද මූල්‍ය ප්‍රකාශන** | | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (වර්ෂ කිහිපයක් සඳහා ලද මූල්‍ය ප්‍රකාශන සහිතව) | 1,371 | 1,430 | 1,536 | 1,643 | **1,566** |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව | 1,289 | 1,345 | 1,412 | 1,479 | **1,456** |
| **3** | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය** | | | | | |
| | සමාලෝචන සංඛ්‍යාව | 1,200 | 1,122 | 731 | 518 | **638** |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව | 1,151 | 1,068 | 678 | 459 | **606** |
| **4** | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග** | | | | | |
| | **අනුකූලවීම්**<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව | 498<br>483 | 553<br>534 | 436<br>417 | 324<br>306 | **430**<br>**413** |
| | **නිරීක්ෂණ සහිතව අනුකූල වීම්**<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව | 697<br>674 | 567<br>541 | 291<br>262 | 185<br>150 | **202**<br>**193** |
| | **අනුකූල නොවීම්**<br>(එකඟතාවයන් සහ විධානයන්)<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව | 5<br>5 | 2<br>2 | 4<br>4 | 9<br>9 | **6**<br>**6** |
| **5** | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සමාලෝචනය කල නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හි % ලෙස** | | | | | |
| | අනුකූලවීම්<br>නිරීක්ෂණ සහිතව අනුකූලවීම්<br>අනුකූල නොවීම්<br>(එකඟතාවයන් සහ විධානයන්) | 42%<br>58%<br>- | 50%<br>50%<br>- | 61%<br>38%<br>1% | 66%<br>32%<br>2% | **68%**<br>**31%**<br>**1%** |

**2.4** 2018 වර්ෂය තුළදී ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් ගෙන් 68% ක් අනුකූලවූ බවද, 31% ක ප්‍රමාණයක් නිරීක්ෂණ සහිතව අනුකූලවූ බව සහ 1% ක් අනුකූලනොවූ බවද අනාවරණය විය.

**2.5** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අදාල අවශ්‍යතාවයන් ගෙන් සැළකිය යුතු ලෙස බැහැරවීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැළකිය යුතු ලෙස වෙනස්වීම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් පහක මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් අතර, ඒවා අතුරින් හතරක් ලැයිස්තුගත අස්ථිත්වයන් සහ එකක් පෞද්ගලික අස්ථිත්වයක් විය. නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ගෙන් ලබා ගන්නා ලද එකඟතාවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ ලාභය/හිමිකම රුපියල් බිලියන 1.1 කින් නිවැරදි කිරීමක් සිදුවිය. ඉදිරිකාලීන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල මෙම එකඟතාවයන් හා අනුකූලව කටයුතු කරන්නේද යන්න පසු විපරම් කරනු ලැබේ. (මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සම්බන්ධ නිරීක්ෂණ සඳහා 16, 17 වන පිටු සහ 2018 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන් සඳහා 18, 19 වන පිටු බලන්න).

**2.6** සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ඉදිරිපත් කිරීමේ අරමුණ ඇතිව SLFRS 9 ක්‍රියාත්මක කිරීමත් සමඟ සමහර ගැලපීම් කිරීමට සහ අතුරු මූල්‍ය ප්‍රකාශන වල එම කරුණ හෙළිදරව් කිරීමට බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකට විධානයක් නිකුත් කරන ලදී.

**2.7** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් ප්‍රමාණවත් වන නමුත් ඒවා ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන විට, එවැනි අනුකූල නොවීම් උපකාරක ලිපි ස්වරූපයෙන් සන්නිවේදනය කරන ලදි. නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වලට තම මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය වැඩි දියුණු කරලීම දිරිගන්වනු පිණිස උපකාර ලිපි 199 ක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

## 3. විගණන පරීක්ෂණ

**3.1** වර්ෂය තුළදී වෘත්තියේ නියුක්ත වරලත් ගණකාධිකාරී ආයතන 10 ක් විසින් සිදුකරන ලද විගණන 50 ක් පරීක්ෂා කරන ලද අතර, ඊට සංසන්දනාත්මකව පූර්ව වර්ෂයේදී ආයතන 13 ක් විසින්

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

සිදුකරන ලද විගණන 100 ක් පරීක්ෂා කරනු ලැබිය. ස්වේච්ඡා පදනමක් මත ආයතන-පුරා ගුණාත්මක පරීක්ෂණ ආරම්භ කිරීම නිසා විගණන පරීක්ෂණ සංඛ්‍යාව අඩුවිය. වර්ෂය තුළදී කරගෙන යන ලද විගණන පරීක්ෂණ 50 ට තේමාමය පරීක්ෂණ 15 ක් ඇතුලත්වූ අතර ඊට සංසන්දනාත්මකව 2017 වර්ෂයේදී තේමාමය පරීක්ෂණ 19 ක් කරගෙන යනු ලැබීය.

**3.2** අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන විගණනය කරනු ලබන විට තම විගණන ආයතනය නිසි කැපවීමෙන් හා අදල විගණන ප්‍රමිතීන්හි අවශ්‍යතා අනුව කටයුතු කිරීම අවශ්‍ය කරමින්, විගණක වරුන් දෙදෙනෙක් වෙත අනතුරු ඇඟවීමේ ලිපි දෙකක් වර්ෂය තුළදී නිකුත් කරනු ලැබීය.

**3.3** වර්ෂය තුළදී පරීක්ෂාවට ලක්කරන ලද විගණන ලිපි ගොනු අවදානම් පාදක ප්‍රවේශය මත තෝරාගන්නා ලදී. කෙසේ වුවද, 2019 වර්ෂය තුළදී භාවිතයට ගැනීම සඳහා වඩාත්ම යෝග්‍ය අවදානම් පාදක ක්‍රමය තීරණය කිරීමට ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට සැලසුම් සකස්කෙරෙමින් පවතී.

**3.4** වර්ෂය තුළදී කරගෙනයන ලද පරීක්ෂණවල ප්‍රතිඵලය වූයේ විගණන ආයතන 9 ක් විසින් සිදුකරන ලද විගණන 12 ක් තුල ඌනතා නිරීක්ෂණය වීමයි, ඊට සංසන්දනාත්මකව 2017 වර්ෂයේදී ආයතන 13 ක් විසින් සිදුකරන ලද විගණන 43 ක් තුල ඌනතා නිරීක්ෂණය විය. වැදගත්වූ කරුණු අදල විගණන ආයතන වෙත සංනිවේදනය කරනු ලැබීය. (විගණන පරීක්ෂණවල විස්තර සඳහා 20, 21 සහ 22 වන පිටු බලන්න).

**3.5** අවදානම් පාදක ප්‍රවේශය සහිත විගණන පරීක්ෂණ හැරෙන්නට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය ආයතනික පාලනයට වගකිව යුත්තන් හා සන්නිවේදනය යන තේමාව යටතේ තේමාමය පරීක්ෂාවන් කරනගෙන ගියේය. 2017 වර්ෂයේදී විගණන ආයතන 06 ක විගණන පිළිබඳව කරනගෙන යනලද තේමාමය පරීක්ෂණ 15 හා සංසන්දනාත්මකව වර්ෂය තුළදී විගණන ආයතන 06 ක විගණන පිළිබඳව තේමාමය පරීක්ෂණ 19 ක් කරගෙන යන ලදි.

## 4. විමර්ශන

ඇඩම් කැපිටල් පොදු සමාගම 2014 සහ 2015 මාර්තු 31 දායින් අවසන්වූ වර්ෂ සඳහා ඇඩම් කැපිටල් පොදු සමාගමේ එවකට සිටි විගණකවරයා විසින් සමාගමේ ගිණුම් පොත්පත් සහ අදාළ ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට අපොහොසත් වීම සම්බන්ධයෙන් විගණන මතය වියාචනය කිරීමත් 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා, වර්තමාන විගණකවරයා විසින් තත්ත්වාග ණනය නොකල විගණන මතයක් නිකුත් කිරීමත් හේතුවෙන්, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් එකී වර්තමාන විගණකවරයා විගණන ප්‍රමිත හා අනුකූල නොවන ආකාරයට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස සමාගමට විධානයක් නිකුත් කරන ලදී. නැවත විගණනය සඳහා වන පිරිවැය සමාගම විසින් දැරීමට අකමැති වූ හෙයින් මෙම කරුණ නීතිපතිවරයා හා සමඟ දැනට සාකච්ඡා වෙමින් පවතී.

## 5. පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන් පිළිබඳ කාර්යසාධනය

2014 සහ 2015 යන වර්ෂවල සියළුම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරමින් පොදු ව්‍යාපාර ව්‍යවසාය කමිටුවට (කෝප් කමිටුවට) ලබාදුන් එකගත්වය ඉටු කිරීමෙන් පසු, අනුකූලතාවය නොදැක්වීම ගැන සොයාගන්නා කරුණුවල ගුණාත්මකභාවය උසස් කිරීම සම්බන්ධයෙන් වඩා හොඳ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන අවදානම් පාදක ක්‍රමය මත තෝරාගැනීම කෙරෙහි යොමුවිය. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සියලුම නියාමනයට යටත්වන අස්ථිත්වයන් වාර්ෂිකව ද ඉහළ අවදානම් සහිත පෞද්ගලික අස්ථිත්වයන් සෑම වසර 3 කදී සහ අඩු අවදානම් සහිත පෞද්ගලික අස්ථිත්වයන් වර්ෂ 5 ක් තුළදී වන පරිදි සියළුම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් වර්ෂ 3-5 දක්වා වූ කාලපරාසයක් තුළදී සමාලෝචනය කිරීමට සලකා බලයි. ප්‍රමිතයන් සහ කේත, ගිණුම්කරණය සහ විගණනය පිළිඹඳව නිරීක්ෂණ වාර්තාවේ (ROSC) ලෝක බැංකුව විසින් ද ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ද ඉහළ අවදානම් සහිත අස්ථිත්වයන් කෙරෙහි විසතරාත්මක අවධානය යොමු කිරීම පක්‍ෂව කරුණු දක්වා ඇත. තවද, 2016 වර්ෂයේ සේවක මණ්ඩලයේ ධාරිතා වර්ධන කටයුතුවල නියැලී සිටි අන්තර්ජාතික උපදේශකවරුන් විසින්ද මෙම ක්‍රමවේදය ගෝලීය වශයෙන් භාවිතා කරන ක්‍රමවේදයක් වශයෙන් හඳුනා ගෙන ඇත.

තවද, 2018 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ වලින් ඉස්මතු වූ අනාවරණයන් තුළින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේදී අවදානම් පාදක පරීක්ෂාව තෝරාගැනීම මඟින් සංකලනිත මූල්‍ය ප්‍රකාශන හා විගණන ක්‍රියාවලිය ශක්තිමත් කර ඇති බව පෙන්නුම් කරයි. එවැනි මූල්‍ය ප්‍රකාශන පිළිඹඳ සමාලෝචනයන් කරගෙනයාම, එවැනි මූල්‍ය ප්‍රකාශන විගණනයේදී විශේෂිත අංශයන් පරීක්ෂා කිරීමට යොමුවීම ඉස්මතු කරවන අතර එමගින් විගණනයන්හි අනුකූල නොවීම් වඩාත් පහසුවෙන් හඳුනාගැනීමට හැකියාවක් ලැබේ.

## 6. ප්‍රමිත ස්ථාපිත කරන්නාට සහයෝගය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව සහ විගණන ප්‍රමිත කමිටුව ගිණුම්කරණ හා විගණන ප්‍රමිති භාවිතයට ගැනීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කර සහයෝගය දක්වයි.

2018 වර්ෂය තුලදී, කමිටු දෙක මගින් කරගෙනයන ලද කටයුතු අතරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2018 සංග්‍රහය සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 2017 සංග්‍රහය නිකුත් කිරීම, මධ්‍ය සහ

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

කුඩා පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (SLFRS for SMEs) ට අවකාශය පටුකිරීමේ සංශෝධන නිකුත් කිරීම 2019 සහ 2020 දී බලපැවැත්වීමට නියමිත දැනට ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංශෝධනය කොට එම ප්‍රකාශනයන් සිංහල සහ දෙමල භාෂාවන්ට පරිවර්තනය කිරීම ඇතුළුව ගැසට් පත්‍රයේ පල කිරීම, නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡාමය පත්‍රිකා සඳහා ප්‍රතිචාර දැක්වීම, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත කමිටුව විසින් නිකුත් කරන ලද අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිතයන් (IFRSs) සහ සංශෝධන විචාරාත්මකව සාකච්ඡා කිරීම සහ ප්‍රමිත පිළිඹඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කරගෙනයාම ඇතලත්වේ.

මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඇතිකරගෙන ඇති වර්තමාන වැඩපිලිවෙල ප්‍රකාරව, ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සහ විගණන ප්‍රමිත කමිටුවේ කටයුතුවලට පහසුකම් සැපයීමේ පිරිවැයෙන් කොටසක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවන ප්‍රදානය රුපියල් මිලියන 4 දක්වා වැඩිකර ඇත. (ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සංස්කරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය වර්ෂය තුලදී කරගෙන යන ලද කටයුතු සඳහා 36 වන පිටුව බලන්න).

## 7. ජාත්‍යන්තර සබඳතා

**7.1** ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ජාත්‍යන්තර සංවිධානයන්හි සාමාජිකත්වය ලබාගැනීම හේතුවෙන් මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතිවලට අනුකූලවීම් සම්බන්ධයෙන් අධික්ෂණය කිරීමට අදාල කරුණු පිළිබඳ ලෝකය පුරා සිදුවන නව වර්ධනයන් සමඟ යාවත්කාලීන දැනුමෙන් යුතුවීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම එය අනෙකුත් නියාමකයන්ගේ තොරතුරු සහ සහාය ලබාගැනීමට සහ ඒකාබද්ධ ක්‍රියාකාරකම් වශයෙන් බොහෝ නියාමකයින්ට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් කරගෙනයාමට කවුළුවක් විවෘතකර ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය වර්ෂය තුළදී, පහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල සිය සාමාජිකත්වය තවදුරටත් පවත්වා ගෙන ගියේය.

(අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේදී පැවැත්වූ පළමු පූර්ණ රැස්වීමේ සිට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙක් වී ඇත.

(ආ) ජාත්‍යන්තර විගණන හා තහවුරුකිරීම් ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශාත්මක නිර්දේශකිරීමේ කණ්ඩායම - 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙකු වශයෙන් පත්කරගන්නා ලදී.

(ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශාත්මක නිර්දේශකිරීමේ කණ්ඩායම - 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය IESBA හි උපදේශාත්මක නිර්දේශකිරීමේ කණ්ඩායමට ඇතුලත්කර ගන්නා ලදී.

**7.2** ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය ජාත්‍යන්තර ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිති (ISAR) පිළිබඳ අන්තර්රාජ්‍ය ප්‍රවීණයන්ගේ කණ්ඩායම් සැසිවාරයන් හිදී ශ්‍රී ලංකාව නියෝජනය කලෝය.

**7.3** ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 2018 පෙබරවාරි 20-22 දින වලදී ශ්‍රී ලංකාවේ පැවති ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) 12 වන සමීක්ෂණ වැඩමුළුවේ සත්කාරකත්වය දැරීය. ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විශේෂ කාර්ය්‍ය භාර අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මහතාගේ විශිෂ්ඨ අනුග්‍රාහකත්වය යටතේ වැඩමුළුවේ ආරම්භක උත්සවය 2018 පෙබරවාරි 19 දින පැවැත්විය. ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ගෞරවනීය ආරාධිතයා විය. IFIAR සභාපති බ්‍රයන් හන්ට් මහතා සහ ජපානයේ IFIAR ලේකම් කාර්යාලයේ විධායක අධ්‍යක්‍ෂක කාල් රෙනර් මහතාද සහභාගි වූහ.

රටවල් 40 කින් සහභාගිවන්නන් 110 ක් කොළඹ වැඩමුළුවට පැමිණ සිටියහ. ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු අතුරු සැසිවාරයන්හි කථිකයන් ලෙස වැඩමුළුවට දායකවිය. කොළඹදී වැඩමුළුව පැවැත්වීම මගින් සියලුම තාක්‍ෂණික කාර්යමණ්ඩලයට IFIAR වැඩමුළුවකට සහභාගිවීමට අවස්ථාවක් ලැබිණ. සමස්තයක් ලෙස, ප්‍රමුඛ පෙලේ දේශීය කථිකයන් හතර දෙනෙක් පූර්ණ සැසිවාර වලට ඉදිරිපත්කිරීම් කලෝය. වැඩමුළුව මගින් ගෝලීය විගණන නියාමකවරුන් අතර දැනුම සහ අත්දැකීම් හුවමාරු කරගැනීමට සහ බොහෝ දැනුම උසස් කරන නව සංවර්ධනයන් සහ විගණන ක්‍ෂේත්‍රයේ අනාගත සංවර්ධනයන්ගේ දිශානතිය සාකච්ඡා කිරීමට හැකියාව ඇතිකලේය. වැඩමුළුව ධනාත්මක සටහනක් සහිතව සමාප්ත විය.

## 8. මානව සම්පත්

### 8.1 කාර්ය මණ්ඩලය

2018 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය විසි එක් දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දහහතර දෙනෙක් වරලත් ගණකාධීකාරීවරු වූහ. සමස්ත තාක්ෂණ කාර්යමණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු එක්කෙනෙක්, අධ්‍යක්ෂවරුන් හය දෙනෙක් සහ සහකාර අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් සමන්විත විය. තාක්‍ෂණික කාර්ය මණ්ඩලයෙන් පස් දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති අතර, නව දෙනෙක් ස්ථිර පදනම මත සේවා නියුක්තව සිටී.

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩ සටහන්වලට වර්ෂය තුළදී අවස්ථා 8 කදී සහභාගිවීමෙන් කාර්ය මණ්ඩලයට මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ නියාමනය හා සම්බන්ධ ක්ෂෙත්‍රයන් පිළිබඳව ජාත්‍යන්තර නිරාවරණ ලබාගෙන ඇත. තවද, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය මගින් කොළඹදී සත්කාරකත්වය දැරූ 2018 IFIAR සමීක්‍ෂණ වැඩමුළුවට සහභාගිවීමට සියළුම තාක්ෂණ කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දෙන ලදි.

## 8.2 බාහිර සමාලෝචන මණ්ඩලය

පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද නිර්දේශ වලට අනුකූලවනු වස් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව වැඩි කිරීමට දරනු ලබන ප්‍රයත්නයේදී මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සඳහා බාහිර සමාලෝචකයින් 12 ක් අඛණ්ඩව සේවයේ යොදා සිටියේය.

බාහිර සමාලෝචකයින් විසින් කරනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය උසස් කිරීමේ අරමුණින් බාහිර සමාලෝචකයින් විසින් කරනු ලබන සමාලෝචනවල සමාලෝචන ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීමක් කාලච්ඡේද පදනමක් මත කරගෙනයනු ලැබේ. එහි ප්‍රතිඵල මත සමාලෝචකගේ සේවය අඛන්ඩව කරගෙනයාම හෝ අවසන් කිරීම කරනු ලැබේ. සමාලෝචකයින් තුල වර්ධනය කලයුතු ක්ෂෙත්‍ර හඳුනාගැනීමට මෙමගින් අවස්ථාව ලැබේ. සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචන වලින් මූල්‍ය වාර්තා කට්ටල 108 ක ප්‍රාථමික සමාලෝචන බාහිර සමාලෝචකයින් විසින් සම්පූර්ණ කරන ලදී. බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය වාර්තා කට්ටල 141 ක ප්‍රාථමික සමාලෝචන කරගෙනයන ලද අතර බාහිර සමාලෝචකයින්ගේ සේවා සඳහා වර්ෂය තුළ රුපියල් මිලියන 2.298 ක මුදලක් දරනු ලැබීය. අතිරේක තොරතුරු ලබාගැනීම, නිවැරදි කිරීම සඳහා එකඟතාවයන්ට එළැඹීම සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීම සහ ව්‍යවස්ථාපිත නිවැරදි කිරීමේ පියවරයන් ගැනීම ඇතුලත් සමාලෝචකයින් විසින් කරගෙන යන ලද සමාලෝචන කටයුතු සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ තාක්ෂණ කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලැබීය. තවද, වසර තුල සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් අතුරින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 530 ක ප්‍රාථමික සමාලෝචන කටයුතු මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

## 9. ආයතනික පාලනය

**9.1** ව්‍යවස්ථාවන්ට අනුව, නිල බලයෙන් පත්කරන ලද සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ හඳුනාගන්නා ලද ආයතනවලින් ලද නාමයෝජනා අතරින් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන්නේ ය. පත්කළ සාමාජිකයන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3 දෙනෙක්), එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා අංශය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා කර්මාන්ත සහ වානිජ මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරනු ලබන තැනැත්තන්ය. සාමාජිකයෙකුගේ නිලකාලය වර්ෂ හතරකි.

**9.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර් ඒ ඒ ජයලත් මහතා 2018 වසරේ දී මණ්ඩලයේ සභාපතිවරයා අඛණ්ඩව සේවය කලේය. ශ්‍රී ලංකා කර්මාන්ත හා වානිජ මණ්ඩල සම්මේලනයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නාමයෝජනා නොලැබීම නිසා මණ්ඩලයේ තනතුරු දෙකක් වර්ෂය අවසානය දක්වා පුරප්පාඩුව පැවතුණි.

**9.3** පනත ප්‍රකාරව මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කල ඒ. ඩී. වාස් ගුණසේකර, එන්. ජයසිංහ සහ එන්. සිවප්‍රගාසම් යන මහත්ම මහත්මීන් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් වල අධ්‍යක්ෂවරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීවරු වශයෙන් සේවය කළහ. එමෙන්ම මණ්ඩලයේ සාමාජිකයන් වූ ඒ. හේරත්, ඩබ්ලිව් ඩබ්ලිව් ජේ. සී. පෙරේරා සහ එල්. එල්. එස්. වික්‍රමසිංහ යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විගණනය කරනු ලබන ගණකාධිකාරී ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කළහ. තවද, මණ්ඩලයේ නිරීක්‍ෂකයින් වූ එච්. එම්. ඒ. ජයසිංහ, එම්. ආර්. වී. ආර්. මීපුර, සහ ටී. ජේ. එස්. රාජකාරීය යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්වල අධ්‍යක්‍ෂවරු වශයෙන් හෝ ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්වල විගණනයන් කරනු ලබන පරිචයෙහි නියුතු විගණන ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කර ඇත. මණ්ඩලයේ ස්වාධීනත්වය සහතිකවීම පිණිස, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ එහි විගණනයට අදාළ සියළු ලිපි ලේඛන/පත්‍රිකා අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ ඒවායේ විගණකවරුන් සමඟ සබඳතා ඇති සාමාජිකයින් වෙත යවන ලේඛන/පත්‍රිකාවලින් ඉවත් කෙරේ. එම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ට අදාළ කරුණු ඇතුළත් සාකච්ඡා සඳහා එවැනි සාමාජිකයෝ සහභාගී නොවේ.

**9.4** කොළඹදී පැවැත්වුනු 2018 IFIAR සමීක්‍ෂණ වැඩමුළුවේ කාර්යය කළමණාකරුවන් ලෙස එට්කින් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පෞද්) සමාගම තෝරාගන්නා ලදි. මණ්ඩලයේ සාමාජිකාවක් වන එන් සිවප්‍රගාසම් මෙනවිය. එයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පෞද්) සමාගමේ උප සමාගමක් වන එට්කින් ස්පෙන්ස් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිළධාරිනියයි. කාර්යය කළමණාකරන ගාස්තු වශයෙන් රු. 1,099,414 ක් එයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පෞද්) සමාගමට වසර තුලදී ගෙවා ඇත.

**9.5** වර්ෂය තුළ මණ්ඩලයේ රැස්වීම් වාර 12 ක් පවත්වන ලදී. වසර තුල මණ්ඩලයේ

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2018

කර්තව්‍යයන් සමස්ථ මෙහෙයුම් දර්ශකයන්ට අනුව කාර්යය මණ්ඩල කාර්යසාධනය සහ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ විගණකවරුන් හා සම්බන්ධ වැදගත් තාක්ෂණික ගැටළු විසඳීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග පිළිබඳව ආවරණය කලේය. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් සිදුකරන ලද ප්‍රමිත වලට අනුකූල නොවීමේ අවස්ථාවන්ට අදාල ගැටලු පිළිබඳව අවධාරණය යොමු කරන ලද අතර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය ලේඛනය සහ ක්‍රියාකාරී සැළසුම අනුමත කිරීමද සිදුකරන ලදී. කොළඹදී පැවැත්වුනු 2018 IFIAR සමීක්ෂණ වැඩමුළුවේ සත්කාරකත්වය තුලින් ලබාගත හැකිවුණු දැනුම හුවමාරු කරගැනීම තුලින් ඉගෙනගත් ගෝලීය පරිචයන් පිළිබඳ දැනුවත්භාවයෙන් තහවුරුවූ සමාලෝචන යාන්ත්‍රනයන්ගේ කාර්‍යක්‍ෂමතාව සහ ඵලදායිකත්වය උසස්කිරීමට ඇති විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමෙහිද මණ්ඩලය නියුක්තව සිටියහ. තවද, තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීම උදෙසා කාර්යමණ්ඩල පාරිශ්‍රමික පිළිවෙත සංශෝධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමේ කාර්යයයෙහි ද මණ්ඩලය නිරත විය.

**9.6** මණ්ඩලයේ අධිකාරී බලය පැවරීමේ ප්‍රතිපත්තිය අනුව, අවශ්‍ය තොරතුරු රැස්කිරීම, මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය කිරීම සහ විමර්ශණ පැවැත්වීම වැනි ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම අධීක්ෂණයට අදාල නිත්‍ය මෙහෙයුම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධීක්ෂණය කරන ලද සහ මඟ පෙන්වන ලද කාර්යමණ්ඩලය විසින් වර්ෂය තුළ කරගෙනයන ලදී.

## 10. මූල්‍ය කාර්යසාධනය

වර්ෂය තුළදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය රජය විසින් සැපයූ අරමුදල් වලින් විය. රජය විසින් සපයන ලද අරමුදල් මගින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු මූල්‍යනය කරනු ලැබුවද, විකල්පයක් ලෙස නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි කොටස් හිමියන්ගේ ස්කන්ධය හෝ බදු ගෙවීමෙන් පසු ලාභය යන ද්විත්වයෙන් වැඩි අගය මත පදනම්ව පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක සෙස් බද්දක් අය කළ හැකිය. කෙසේ වුවද, මෙම විකල්පය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වැඩි කැමැත්තක් නොදැක්වූ අතර එහි ප්‍රතිඵලයක් සේ 2008 ජනවාරි 01 දින හෝ ඊට පසුව ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ සෙස් බද්ද 2008 ඔක්තෝබර් 07 දින ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.

වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මෙහෙයුම් වියදම රුපියල් 90,138,101 ක් වූ අතර ඊට අනුරූප පූර්ව වර්ෂයේ වියදම රුපියල් 84,352,282 ක් විය. මෙහෙයුම් වියදමේ වැඩිවීම කාර්යමණ්ඩල පිරිවැය, ජාත්‍යන්තර සංවිධානවලට දයක මුදල් සහ කාර්යමණ්ඩල ධාරිතා වර්ධනයට අදාල දේශීය සහ ජාත්‍යන්තර වියදම් යනාදියේ වැඩිවීම නිසා සිදුව ඇත. මෙහෙයුම් වියදම් වලින්, කාර්යමණ්ඩල පිරිවැය පූර්ව වර්ෂයට වඩා 4% ආන්තික වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් 44,084,317 ක් වූ අතර ඊට අනුරූප පූර්ව වර්ෂයේ වියදම රුපියල් 42,351,100 ක් විය. තවද, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩල පිරිවැය, 2017 ට සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කරමින්, මෙහෙයුම් වියදම්වලින් 49% ක් විය.

2018 පෙබරවාරියේදී කොළඹදී පැවැත්වුනු 2018 IFIAR සමීක්ෂණ වැඩමුළුවේ සත්කාරකත්වය දැරීමේදී රු. 11,654,353 ක මුළු පිරිවැයක් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය දැරීය. වැඩමුළුවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වූයේ එක්සත් ජනපද ඩොලර් වලින් ලැබුනු සහභාගිවන්නන්ගේ ගාස්තුය. තවද, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට වැඩමුළුවේ සත්කාරකත්වය දැරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදුන් අවස්ථාවේ භාණ්ඩාගාරය විසින් රු. 1,175,000 ක් ප්‍රදානය කෙරිණ. වැඩමුළුවට අදල වියදම් පියවාගැනීමෙන් පසු, කොළඹදී පැවැත්වුනු 2018 IFIAR සමීක්ෂණ වැඩමුළුවේ සත්කාරකත්වය දැරීමෙන් ලැබූ ශුද්ධ ආදායම වූ රු. 1,165,586 ක් මණ්ඩලය විසින් භාණ්ඩාගාරයට ආපසු දෙන ලදී.

## 11. කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය

- පහත කරුණු හැරුණු විට 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ / අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | නීතිරීති/ විධානයටයොමුව | විස්තරය |
|---|---|---|
| **(අ)** | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත - 12(1)(ආ)(v)වගන්තිය | ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් ඉදිරිපත් කරනු ලබන නම්වලින් මූල මණ්ඩලයකින් තෝරා ගනු ලබන තැනැත්තෙකු මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා පත් කළ යුතු වුවද, සම්මේලනය විසින් එම නම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මේ දක්වා එම සාමාජිකයා පත් කර නොතිබුණි. |
| **(ආ)** | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත - 12(1)(ආ)(vii) වගන්තිය | ගිණුම්, කළමණාකරණය හෝ ව්‍යාපාර පරිපාලන අංශ, පීඨ සහ පශ්චාත් උපාධි ආයතන නියෝජනය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාලපනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන තැනැත්තන් තුන්දෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් තෝරා ගනු ලැබූ එක් තැනැත්තෙක් මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා පත් කළ යුතු වුවද,මේ දක්වා එම සාමාජිකයා පත් කර නොතිබුණි. |
| **(ඇ)** | චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ - ජේද අංක 9.6 | විධිමත් කාර්යසාධන ඇගයීමේ පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. |
| **(ඈ)** | චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ - ජේද අංක 9.14 | මණ්ඩලය විසින් විගණිත දිනය තෙක් ක්‍රියාපටිපාටි අත්පොතක් අනුමත කර නොතිබුණි. |
| **(ඉ)** | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 - ජේද අංක 4 | මණ්ඩලය විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**3. වෙනත් කරුණු**

**(අ)** කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට මණ්ඩලය විසින් සිලෝන් බයිබල් හවුස් සමඟ 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 04 ක කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා කුලිය ලෙස රු. 4,149,492 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අපේක්ෂිත අරමුණ සඳහා එම මහල යොදා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර කාර්යාලයේ අභ්‍යන්තර ඉදිකිරීම් මේ දක්වා ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** මණ්ඩලය සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතියක් අධ්‍යයනය, සැලසුම් කිරීම, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජූනි 03 දින ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, එය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ)** කාර්යසාධනය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත අනුව, මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ, නිශ්චිත ව්‍යාපාර ආයතන මඟින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීමයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(i) නිශ්චිත ව්‍යාපාර ආයතන ප්‍රමාණය හඳුනා ගැනීමට මණ්ඩලය විසින් උචිත යාන්ත්‍රණයක් හඳුන්වා දී හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. 2007 අංක 07 දරන නව සමාගම් පනත බලාත්මක වීමත් සමඟ සමාගම්වල ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් පෞද්ගලික මූල්‍ය සමාගම්වල මූල්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. එම නිසා සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගෙන් තොරතුරු ලබාගැනීමට නොහැකි වූ බව මණ්ඩලය විසින් විගණනයට දැනුම්දෙන ලදී.

(ii) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව විගණනය විසින් ඉල්ලීම් කළ තොරතුරු සැපයීම සඳහා ගිවිසුම්ගත ගාස්තුව රු. 75,000 +වැට් බදු සහ සත්‍ය වියදම ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරුන් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම තොරතුරු 2019 මැයි 09 දින ඉදිරිපත් කළද, එය අපේක්ෂිත මට්ටමට නොවීය. කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් ප්‍රධාන මෙහෙයුම් කටයුතුවලට අදාල විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය තොරතුරු මණ්ඩලය සතුව නොපැවතුණු බව නිරීක්ෂණය විය.

(iii) මණ්ඩලය විසින් සමහර නිශ්චිත ව්‍යාපාර ආයතන සම්බන්ධයෙන් මේ වනවිටත් සන්නිවේදනය කර තිබූ සොයාගැනීම් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. එම නිරීක්ෂණවලට අනුකූලවීම හුදෙක් ඔවුන්ගේ කැමැත්ත මත සිදු වන බවත්, අදාල ආයතන විසින් ප්‍රතිචාර දැක්වීම ධෛර්යමත් කිරීම තුළින් අනුකූලවීම් වර්ධනය කිරීමට ඔවුන්ව පෙළඹවීමේ වක්‍ර මිනුමක් ලෙස ප්‍රතිපෝෂණ පෝරම හඳුන්වා දී තිබුණද, එම ප්‍රතිපෝෂණ පෝරම සඳහා නිශ්චිත ව්‍යාපාර ආයතන විසින් ප්‍රතිචාර දැක්වීම අනිවාර්ය නොවන බව මණ්ඩලය විසින් විගණනයට දැනුම්දෙන ලදී.

**(ඈ)** කාර්ය මණ්ඩලය කළමනාකරණය

(i) 2019 මාර්තු 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් පැවති අතර ඉන් පුරප්පාඩු 08 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ii) මීට අමතරව, මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 අප්‍රේල් 24 දින සිට පුරප්පාඩු විය. කෙසේ වුවද පවතින වැටුප් පරිමාණය තාක්ෂණික දැනුමැති ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරයෙකු සඳහා වෙළඳපලේ පවතින වැටුපට වඩා පහළ මට්ටමක් බැවින් ඒ යටතේ එම තනතුර සඳහා සුදුසු අයදුම්කරුවකු බඳවා ගැනීමට නොහැකි වී ඇති බව මණ්ඩලය විසින් විගණනයට දැනුම්දෙන ලදී.

(iii) මණ්ඩලයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීම් සිදු කර තිබුණි

(iv) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට පරිබාහිරව කොන්ත්‍රාත් පදනමින් බඳවාගන්නා ලද නිලධාරීන් දෙදෙනෙකුට ඉහළ වැටුපක් සහ වෙනත් ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මෙම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා අනුමත වැටුප් පරිමාණය යටතේ අවශ්‍ය අත්දැකීම් සහිත තාක්ෂණික දැනුමැති ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බඳවා ගැනීමට නොහැකි බැවින් මෙම තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමට බඳවාගැනීම් සිදුකරන ලද බව මණ්ඩලය විසින් විගණනයට දැනුම්දෙන ලදී.

අත්සන් කරන ලදී

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**

**විගණකාධිපති**

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දිනට | සටහන | 31-දෙසැ-18<br>රු. | 31-දෙසැ-17<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 14,392,976 | 24,567,695 |
| තැන්පතු | 4 | 6,979,736 | 6,979,736 |
| | | 21,372,712 | 31,547,431 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 5 | 698,514 | 516,831 |
| ලැබිය යුතු දෑ | 6 | 3,029,089 | 3,376,423 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 7 | 39,328 | 7,927,900 |
| | | 3,766,931 | 11,821,154 |
| **මුළු වත්කම්** | | 25,139,643 | 43,368,585 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 8 | 18,653,237 | 30,256,006 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 9 | 1,187,774 | 1,291,425 |
| | | 19,841,011 | 31,547,431 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 10 | - | 1,124,759 |
| විලම්බිත ආදායම් - IFIAR වැඩමුළුව | | - | 6,719,098 |
| ගෙවිය යුතු දෑ | 11 | 5,298,632 | 3,977,297 |
| | | 5,298,632 | 11,821,154 |
| **මුළු වගකීම්** | | 25,139,643 | 43,368,585 |

*49 වන පිටුවේ සිට 55 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.*

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වගකිව යුතු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්
දිනය: 2019 ජනවාරි 29

අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන)

# මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 12 | **94,138,101** | 86,852,282 |
| අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ලබාදුන් ප්‍රදාන | | **4,000,000** | 2,500,000 |
| | | **90,138,101** | 84,352,282 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩල සාමාජික දීමනා | | **(1,360,500)** | (1,253,250) |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 13 | **(193,200)** | (160,000) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 14 | **(44,084,317)** | (42,351,100) |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | **(1,869,995)** | (1,659,290) |
| පුවත්පත් නිවේදන | | **(551,356)** | (435,225) |
| කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු | | **(11,692,318)** | (11,191,842) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3 | **(10,174,715)** | (9,769,265) |
| විදුලි වියදම් | | **(1,304,175)** | (1,391,243) |
| සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු | | **(2,438,000)** | (1,920,000) |
| අන්තර්ජාතික සාමාජිකත්වයන් | | **(2,595,809)** | (1,778,911) |
| පොත් හා වාර සඟරා | | **(1,341,583)** | (1,186,311) |
| ජාත්‍යන්තර ගමන් | | **(4,675,184)** | (3,994,965) |
| පුහුණුව හා සංවර්ධනය | | **(2,402,223)** | (982,649) |
| බලපත්‍ර හා රක්ෂණ | | **(1,014,334)** | (1,005,800) |
| ලිපි ද්‍රව්‍ය | | **(677,056)** | (659,804) |
| වෙනත් පරිපාලන වියදම් | 15 | **(3,763,336)** | (4,612,627) |
| | | - | - |
| **වෙනත් විස්තීර්ණ අදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීමෙන් ලාභය / (පාඩුව) | | **19,574** | (454,840) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීමට අදාල රජයේ ප්‍රදාන | | **(19,574)** | 454,840 |
| | | - | - |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්ත/(හිඟය)** | | - | - |

*49 වන පිටුවේ සිට 55 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.*

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල රු. |
|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** |

*49 වන පිටුවේ සිට 55 පිටුව දක්වා මූලය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූලය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.*

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | | - | - |
| ගැලපීම්; | | | |
| වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන | | 81,391,000 | 78,656,000 |
| මුළු විස්තීර්ණ ආදායම්වලට මාරුකල විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 12 | (94,118,527) | (87,307,122) |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබු ප්‍රදානයන් | | - | (1,575,000) |
| ක්ෂය වීම් | 3 | 10,174,715 | 9,769,265 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | | 3 | 1 |
| පාර්තෝෂික අරමුදලේ ආයෝජනයෙන් ලද පොළිය | | (425,339) | (455,461) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 14.1 | 696,349 | 1,184,967 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර වියදමට වැඩි ආදායම / (ආදායමට වැඩි වියදම) | | (2,281,799) | 272,650 |
| කුලී තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | - | (100,000) |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (181,683) | 60,034 |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | | 347,335 | (198,757) |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | | 1,321,334 | 402,471 |
| IFIAR සමීක්ෂණ වැඩ මුළුව සඳහා ලද ලියා පදිංචි ගාස්තු | | (6,719,098) | 6,719,098 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (7,513,911) | 7,155,496 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | - | (1,793,824) |
| පාර්තෝෂික අරමුදලේ ආයෝජනය | | (800,000) | - |
| පාර්තෝෂික අරමුදලේ/ආරක්ෂිත සේප්පුවේ ආයෝජනයෙන් ලද පොළිය | | 425,339 | 455,461 |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | | (7,888,572) | 5,817,133 |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | - | - |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (7,888,572) | 5,817,133 |
| වසර ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 7,927,900 | 2,110,767 |
| **වසර අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ** | 7 | 39,328 | 7,927,900 |

*49 වන පිටුවේ සිට 55 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.*

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2019 ජනවාරි 29 වන දින පැවති රැස්වීමේදී මණ්ඩලයේ සාමාජිකයින්ගේ යෝජනාවලියකින් අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ.

2018 දෙසැම්බර් 31 දිනට ස්ථිර පදනම මත සේවකයින් 14 දෙනෙකු, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 5 දෙනෙකු හා තාවකාලික පදනම මත සේවකයින් 2 දෙනෙකු මණ්ඩලය විසින් සේවයේ යොදවා තිබිනි. (2017 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයින් 15 ක්, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 6 ක් සහ තාවකාලික පදනම මත සේවකයින් 1 කෙනෙකු විය.)

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය හා උපචිත පදනම මත ගිණුම් සැකසීම සඳහා වූ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සකස් කෙරේ.

මූල්‍ය ප්‍රකාශන, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන පිළියෙල කරන අතර ගිණුම් ප්‍රතිපත්ති කාලපරිච්ඡේදය පුරාම යථානුරූපීව භාවිතයට ගනු ලැබේ.

### වාර්තාකරන දිනයෙන් පසු සිදු වූ සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් සලකා බලන අතර අවශ්‍යවන පරිදි යෝග්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කෙරේ.

### දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල අගයට දක්වනු ලැබේ. වත්කම්වල තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂයවීම් මූල්‍ය කාර්යසාධනය පිළිඹඳ ප්‍රකාශනයට අය කෙරේ.

| විස්තරය | තක්සේරු කරන ලද |
|---|---|
| ප්‍රයෝජනවත් ජීවිත කාලය | |
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | වර්ෂ 4 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | වර්ෂ 6-10 |
| පොත්පත් හා ප්‍රකාශන | වර්ෂ 3 |

මිලට ගත් මාසයේදී පූර්ණ ක්ෂය ගණනය කරන නමුත් විකුණන මාසයට ක්ෂය ගණනය නොකර, මිලදී ගත් වර්ෂයේදී හා විකුණන ලද වර්ෂයේදී පාවිච්චි කරන ලද කාලය මත පදනම්ව ක්ෂය ප්‍රතිපාදනය කෙරේ.

පොත්පත් හා සඟරා හැර වටිනාකම රු. 7,500/- ට අඩු සියළුම අයිතමයන්, ගිණුම්කරණ ප්‍රමිති, විගණන ප්‍රමිති හා වටිනාකම රු. 1,000/- ට වැඩි නොවන අනෙකුත් ප්‍රකාශන, මිලට ගත් වර්ෂයේ වියදමක් ලෙස සලකනු ලැබේ.

### තොග

තොග අගය කරන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයයටය. තොග පිරිවැය තීරණය කරන්නේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (FIFO) පදනම අනුවය.

### ලැබිය යුතු දෑ

සියළුම ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තුගත අගයට දක්වන අතර, අවශ්‍යවන පරිදි මූල්‍ය ප්‍රකාශන වල බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

### මුදල් හා මුදල් සමාන දෑ

බැංකුවේ සහ අතැති මුදල් සහ කල්පිරෙන දින තෙක් ඇති කෙටිකාලීන තැන්පතු, ඒවායේ පිරිවැයට දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ බැංකු තැන්පතුවලින් බැංකු අයිරා හිලව් කිරීමෙනි.

### ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ සඳහා වගකීම්, ගෙවීමට බලාපොරොත්තු වන මුදල් සහ මුදල් සමාන දෑ වල වටිනාකමට දැක්වේ.

### නිශ්චිත ප්‍රතිලාභ පිරිවැය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වූ නිශ්චිත ප්‍රතිලාභ වගකීම, නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පෙන්නුම් කරයි. සියලු ආයුගණක ලාභයන් සහ අලාභයන් මූල්‍ය කාර්ය සාධනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනේ.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගන්නේ අදාළ වියදම හඳුනාගනු ලබන කාලපරිච්ඡේදයේදීමය. ඉදිරි කාලපරිච්ඡේදයන් තුළ වියදමක් වන වත්කම් අත්පත් කරගැනීම සඳහා භාවිතා කරනු ලබන රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම් වලින් වගකීම් (ලැබුණු රාජ්‍ය ප්‍රදාන වලට අදාළ වගකීම් හැර) අඩු කල විට නියෝජනය වන රාජ්‍ය ප්‍රදාන වගකීම් ලෙස හඳුනාගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 3. දේපළ, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ලී බඩු සහ සවිකිරීම් | | පුස්තකාල පොත් | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිනට | 2018 දෙසැ. 31 | 2017 දෙසැ. 31 | 2018 දෙසැ. 31 | 2017 දෙසැ. 31 | 2018 දෙසැ. 31 | 2017 දෙසැ. 31 | 2018 දෙසැ. 31 | 2017 දෙසැ. 31 | 2018 දෙසැ. 31 | 2017 දෙසැ. 31 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 51,160,000 | 51,160,000 | 12,507,865 | 8,983,997 | 11,496,914 | 11,155,887 | 3,198,399 | 3,190,899 | 78,363,178 | 74,490,783 |
| එකතු කිරීම් | - | - | - | 3,552,858 | - | 341,027 | - | 7,500 | - | 3,901,385 |
| ඉවත් කිරීම් | - | - | (174,654) | (28,990) | (76,501) | - | - | - | (251,155) | (28,990) |
| මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 51,160,000 | 51,160,000 | 12,333,211 | 12,507,865 | 11,420,413 | 11,496,914 | 3,198,399 | 3,198,399 | 78,112,022 | 78,363,178 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 32,042,665 | 23,610,665 | 8,316,247 | 7,418,484 | 10,273,314 | 9,888,950 | 3,163,257 | 3,137,108 | 53,795,483 | 44,055,206 |
| වර්ෂය තුළ ක්ෂය වියදම් | 8,432,000 | 8,432,000 | 1,397,420 | 952,372 | 320,267 | 358,744 | 25,028 | 26,149 | 10,174,715 | 9,769,265 |
| ඉවත් කිරීම් මත ක්ෂය | - | - | (174,652) | (28,989) | (76,500) | - | - | - | (251,152) | (28,989) |
| මාරු කිරීම් | - | - | - | (25.620) | - | 25,620 | - | - | - | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 40,474,665 | 32,042,665 | 9,539,015 | 8.316,247 | 10,517,081 | 10,273,314 | 3,188,285 | 3,163,257 | 63,719,046 | 53,795,483 |
| වර්ෂය අවසානයේ ලියා අඩුකල අගය | 10,685,335 | 19,117,335 | 2,794,196 | 4,191,618 | 903,331 | 1,223,600 | 10,114 | 35,142 | 14,392,976 | 24,567,695 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 2018 දෙසැ 31<br>රු. | 2017 දෙසැ 31<br>රු. |
|---|---|---|
| **4. තැන්පතු (ජංගම නොවන)** | | |
| කුලී තැන්පතු | 6,879,736 | 6,879,736 |
| ආරක්ෂක සේප්පු තැන්පතු | 100,000 | 100,000 |
| | 6,979,736 | 6,979,736 |
| **5. තොග** | | |
| ලිපි ද්‍රව්‍ය | 698,514 | 516,831 |
| **6. ලැබිය යුතු දෑ** | | |
| ඉදිරියට කළ ගෙවීම් | 2,739,670 | 2,899,773 |
| උපදේශකවරයාට කොටස් වශයෙන් ගෙවීම | 259,419 | - |
| තැන්පතු | 30,000 | 30,000 |
| ඉදිරියට කළ ගෙවීම් - IFIAR 12 වන සමීක්ෂණ වැඩමුළුව | - | 446,650 |
| | 3,029,089 | 3,376,423 |
| **7. මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 39,328 | 484,452 |
| බැංකුවේ ඇති මුදල - IFIAR 12 වන සමීක්ෂණ වැඩමුළුව ට සම්බන්ධිත | - | 7,443,448 |
| | 39,328 | 7,927,900 |

**7.1** ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය 2018 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වූ ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) 12 වන සමීක්ෂණ වැඩමුළුව සඳහා සත්කාරක ආයතනය වශයෙන් කටයුතු කලාය. අවසාන ආදායම් සහ වියදම් සටහන 16 හි ප්‍රතිබිම්බනය වේ.

| | 2018 දෙසැ 31<br>රු. | 2017 දෙසැ 31<br>රු. |
|---|---|---|
| **8. විලම්බිත ආදායම් – රාජ්‍ය ප්‍රධාන (ජංගම නොවන)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 30,256,006 | 37,208,854 |
| ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා | | |
| - ලැබුණු හා වැයකල විශේෂ ධාරිතා අයවැයේ අරමුදල් | - | 532,561 |
| ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා ලැබුණු හා වැයකල ප්‍රදාන | - | 1,793,824 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබුණු රාජ්‍ය ප්‍රදාන | - | 1,575,000 |
| තැන්පතු වැඩිවීම (ජංගම නොවන) | - | 100,000 |
| පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කල ලැබුණු ප්‍රදාන | 800,000 | - |
| වර්ෂය සඳහා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | (10,174,715) | (9,769,265) |
| පාරිතෝෂික අරමුදලෙන් ලැබු පොළිය | 425,339 | 455,461 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | (3) | (1) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්ෂය තුළ ප්‍රතිපාදන | (1,121,689) | (1,640,428) |
| වර්ෂය අවසානයේ ශේෂය | 20,184,938 | 30,256,006 |
| විලම්බිත ආදායම් වලින්- රාජ්‍ය ප්‍රදාන (ජංගම) වලින් මාරු කිරීම් | (1,531,701) | - |
| | 18,653,237 | 30,256,006 |
| **නියෝජනය වන්නේ** | | |
| දේපළ පිරියත හා උපකරණ | 14,392,976 | 24,567,695 |
| තැන්පතු (ජංගම නොවන) | 6,979,736 | 6,979,736 |
| පාරිතෝෂික අරමුදලේ අතිරික්තය / (පාරිතෝෂික වෙන්කිරීම්) | (1,187,774) | (1,291,425) |
| | 20,184,938 | 30,256,006 |
| විලම්බිත ආදායම් වලින්- රාජ්‍ය ප්‍රදාන (ජංගම) වලින් මාරු කිරීම් | (1,531,701) | - |
| | 18,653,237 | 30,256,006 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 2018 දෙසැ 31<br>රු. | 2017 දෙසැ 31<br>රු. |
|---|---|---|
| **9. නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 6,358,156 | 4,717,728 |
| වර්ෂය තුළ ප්‍රතිපාදන | 613,847 | 696,832 |
| වර්ෂය සඳහා පොළිය | 527,415 | 488,756 |
| ආයුගණක ලාභ/පාඩු | (19,574) | 454,840 |
| | 7,479,844 | 6,358,156 |
| වර්ෂය තුළ ගෙවීම් | (2,432,051) | - |
| | 5,047,793 | 6,358,156 |
| පාරිතෝෂික අරමුදල (සටහන් 9.1) | (4,022,968) | (5,066,731) |
| | 1,024,825 | 1,291,425 |
| ගෙවියයුතු පාරිතෝෂික ගෙවීම්වල උපයනවිට ගෙවීමේ බද්ද | 162,949 | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 1,187,774 | 1,291,425 |

ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත.

| | | |
|---|---|---|
| අපේක්ෂිත වේතන වැඩිවීම | 10% | 10% |
| වට්ටම්/පොලී අනුපාතය | 12.23% | 12.11% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 9% | 9% |

| | | |
|---|---|---|
| **9.1 පාරිතෝෂික අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 5,066,731 | 4,611,270 |
| වර්ෂය තුළ සිදුකරන ලද ආයෝජන | 800,000 | - |
| වර්ෂය තුළ ලැබුණු පොළිය | 425,339 | 455,461 |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (2,269,102) | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 4,022,968 | 5,066,731 |
| **10. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,124,759 | 2,290,471 |
| තොග සහ ලැබිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | (165,651) | 138,724 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | (7,888,572) | 5,817,133 |
| විලම්බිත ආදායම් සහ ගෙවිය යුතු දෑ වල (වැඩිවීම්)/අඩුවීම් | 5,397,764 | (7,121,569) |
| වර්ෂය අවසානයේ ශේෂය | (1,531,701) | 1,124,759 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන) වලට මාරු කිරීම් | 1,531,701 | - |
| | - | 1,124,759 |
| **නියෝජනයවන්නේ** | | |
| තොග | 698,514 | 516,831 |
| ලැබිය යුතු දෑ | 3,029,089 | 3,376,423 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 39,328 | 7,927,900 |
| අඩුකලා: විලම්බිත ආදායම්-IFIAR 12 වන සමීක්ෂණ වැඩමුළුව | - | (6,719,098) |
| අඩුකලා: ගෙවිය යුතු දෑ | (5,298,632) | (3,977,297) |
| වර්ෂය අවසානයේ ශේෂය | (1,531,701) | 1,124,759 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන) වලට මාරු කිරීම් | 1,531,701 | - |
| | - | 1,124,759 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 2018 දෙසැ 31 රු. | 2017 දෙසැ 31 රු. |
|---|---|---|
| **11. ගෙවිය යුතු දෑ** | | |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 320,000 | 320,000 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන | 2,000,000 | 1,250,000 |
| සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු | 735,000 | 260,000 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | 949,000 | 1,014,000 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 1,294,632 | 1,133,297 |
| | 5,298,632 | 3,977,297 |

| දිනට | 2018 දෙසැ 31 රු. | 2017 දෙසැ 31 රු. |
|---|---|---|
| **12. රාජ්‍ය ප්‍රදාන** | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 81,391,000 | 78,656,000 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබුණු රාජ්‍ය ප්‍රදාන | - | (1,575,000) |
| තැන්පතු වැඩිකිරීම සඳහා යෙදවූ ප්‍රදාන | - | (100,000) |
| පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කල ලැබු ප්‍රදාන | (800,000) | - |
| ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවූ ප්‍රදාන | - | (1,793,824) |
| ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කල ප්‍රදාන | 2,656,459 | 1,165,713 |
| වර්ෂය සඳහා ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 10,174,715 | 9,769,265 |
| පාරිතෝෂික අරමුදලින් ලැබූ පොළිය | (425,339) | (455,461) |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | 3 | 1 |
| වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 1,141,262 | 1,185,588 |
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන ප්‍රදාන | 94,138,101 | 86,852,282 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීම සම්බන්ධ ප්‍රදාන | (19,574) | 454,840 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන මුළු විස්තීර්ණ ආදායම්වලට මාරු කරන ලද මුළු ප්‍රදානයන් | 94,118,527 | 87,307,122 |
| **13. විගණකවරුන්ගේ පාරිශ්‍රමික** | | |
| වර්ෂයේ වියදම් | 160,000 | 160,000 |
| පසුගිය වසරේ (අධි)/ඌන වෙන් කිරීම් | 33,200 | - |
| | 193,200 | 160,000 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2018 දෙසැ 31 රු. | 2017 දෙසැ 31 රු. |
|---|---|---|
| **14. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | **21,858,386** | 19,208,809 |
| සේවක අර්ථසාධක අරමුදල | **2,780,709** | 2,519,477 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල | **695,177** | 565,502 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් (සටහන 14.1) | **715,923** | 730,127 |
| වාහන කුලී සහ රියදුරු වැටුප් | **1,218,240** | 1,512,489 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා | **12,002,683** | 12,168,000 |
| සෞඛ්‍ය රක්ෂණය | **483,101** | 518,379 |
| කාර්ය මණ්ඩල ශුභසාධනය | **780,029** | 849,060 |
| වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | **3,550,068** | 4,279,256 |
| | **44,084,317** | 42,351,100 |
| **14.1 නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය සඳහා ගාස්තු | **613,847** | 696,832 |
| වර්ෂය සඳහා ශුද්ධ පොලිය | **102,076** | 33,295 |
| | **715,923** | 730,127 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හෙළිදරව්කල ආයුෂණක ලාභ/අලාභ | **(19,574)** | 454,840 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි හෙළිදරව් කල නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | **696,349** | 1,184,967 |
| **15. වෙනත් පරිපාලන වියදම්** | | |
| වර්ෂික වාර්තා | **397,605** | 357,002 |
| පරිඝනක නඩත්තු වියදම් | **104,385** | 180,508 |
| උපකරණ නඩත්තු වියදම් | **154,360** | 231,060 |
| දුරකථන වියදම් | **764,274** | 658,273 |
| වාහන නඩත්තු වියදම් | **881,546** | 1,614,599 |
| කාර්යාල වියදම් | **401,445** | 501,432 |
| ලේකම් ගාස්තු | **90,000** | - |
| නෛතික හා වෘත්තියවේදී ගාස්තු | **128,628** | 308,383 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | **170,000** | 170,500 |
| වෙනත් | **671,093** | 590,870 |
| | **3,763,336** | 4,612,627 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2018 දෙසැ 31<br>රු. | 2017 දෙසැ 31<br>රු. |
|---|---|---|

## 16. IFIAR 12 වන සමීක්ෂණ වැඩමුළුව 2018 – ආදායම් සහ වියදම්

| | 2018 දෙසැ 31 රු. | 2017 දෙසැ 31 රු. |
|---|---|---|
| **ආදායම්** | | |
| සහභාගිවන්නන්ගේ ගාස්තු | 11,584,015 | - |
| භාණ්ඩාගාර අරමුදල් | 1,175,000 | - |
| ඉල්ලුවිට ලැබෙන තැන්පතු පොලිය | 60,924 | - |
| | 12,819,939 | - |
| **වියදම්** | | |
| සිද්ධි කළමණාකරන ගාස්තුව | 1,099,414 | - |
| වැඩමුළුව පැවැත්වූ ස්ථානය හා සම්බන්ධ වියදම් | 4,851,312 | - |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ හා සම්බන්ධ වියදම් | 2,201,410 | - |
| වෙනත් | 3,502,217 | - |
| | 11,654,353 | - |
| වියදමට වැඩි ආදයම | 1,165,586 | |
| අඩුකලා: භාණ්ඩාගාරයට ආපසු දුන් අතිරික්ත අරමුදල් | (1,165,586) | - |
| | - | - |

## 17. ප්‍රාග්ධන වගකීම් වලට බැඳීම්

2017 ජනවාරි 01 වන දින සිට කුලියට ගන්නා ලද නව පරිශ්‍රයේ අභ්‍යන්තර සැලසුම් හා ඉදිකිරීම් කටුයුතු සිදුකිරී සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් මේ සඳහා මේ වනතෙක් වගකීම් වලට බැඳීම් එළඹී නොතිබිණි. (2017 දෙසැම්බර් 31 දිනට - කිසිත් නැත.)

## 18. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

2018 පැවැත්වූ ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ 12 වන සමීක්ෂණ වැඩමුළුවට අදාළ ක්‍රියාකාරකම් සඳහා, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තෝරාගන්නා ලද සිද්ධි කළමනාකාර ආයතනය වීයිටිකන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගමයි. මණ්ඩලයේ සාමාජිකාවක් වන, නිලන්ති සිවප්‍රගාසම් මෙනවිය එයිට්කන් ස්පෙන්ස් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිළධාරිනියයි. සිද්ධි කළමනාකරණය සඳහා ගෙවූ මුළු ගාස්තුව රු. 1,099,414/- විය.

## 19. අසම්භාව්‍ය බැරකම්

2018 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොමැත. (2017 දෙසැම්බර් 31 ට - කිසිත් නැත.)

## 20. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවී නොමැත.

# විගණකාධිපති වාර්තාවේ යොමුකර ඇති ගැටළුවල වර්තමාන තත්වය

| ගැටළුව | විස්තර සටහන | ක්‍රියාව භාර තැනැත්තා | ගන්නා ලද ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| **නීති සහ නියමයන්** | | | | |
| (අ) මණ්ඩලයට සාමාජිකයන් පත්කිරීමට කර්මාන්ත සහ වාණිජ මණ්ඩල සම්මේලනයෙන් නාමයෝජනා ලැබී නැත | 2018 වසර තුළදී මුදල් අමාත්‍යාංශයට නාමයෝජනා ලැබී නැත. කෙසේ වුවද ඒ සම්බන්ධව මෙතෙක් ප්‍රතිචාරයක් ද ලැබී නැත. | අධ්‍යක්ෂ ජනරාල් | කළමණාකරණය විසින් කර්මාන්ත සහ වාණිජ මණ්ඩල සම්මේලනයේ ප්‍රධාන ලේකම් සමග මේ සම්බන්ධව බොහෝ පසු විපරම් උත්සාහයන් ගෙන ඇත. | කර්මාන්ත සහ වාණිජ මණ්ඩල සම්මේලනය නියෝජනය කෙරෙන මණ්ඩල සාමාජික තනතුර හිස්ව පවතී |
| (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් (UGC) නාමයෝජනා ලැබී නැත | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 වසර තුළදී නාමයෝජනා එවා නැත. 2019 ජුලි මාසයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් මණ්ඩල සාමාජිකයකු නම් කර ඇත. | අධ්‍යක්ෂ ජනරාල් | 2019 ජුලි මාසයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් මණ්ඩල සාමාජිකයකු නම් කර ඇත. | අනුකූලතාවය දක්වා ඇත |
| (ඇ) විධිමත් කාර්යක්ෂමතා ඇගයීමේ ක්‍රම පද්ධතියක් හඳුන්වා දී නොමැත | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ තාක්ෂණික කාර්යය මණ්ඩලය කරනු ලබන ක්‍රියාකාරකම් වලට ගැලපෙන ලෙස කාර්යක්ෂමතා ඇගයීමේ ආකෘති පත්‍රය ට බොහෝ සංස්කරණයන් කෙරිණ. | අධ්‍යක්ෂ ජනරාල් | කාර්යක්ෂමතා ඇගයීම කාර්යය මණ්ඩලයට සංනිවේදනය කර ඇත | පලමු ඇගයීම 2019 ඔක්තෝබර් 15 සිට 2019 දෙසැම්බර් 31 දක්වා පැවැත්වෙනු ඇත. |
| (ඈ) ක්‍රියා පටිපාටි අත්පොත මණ්ඩලය විසින් අනුමත කර නැත | 2019 මැයි මස 16 දින විගණන කමිටුව විසින් ක්‍රියා පටිපාටි අත්පොත අනුමත කිරීමෙන් අනතුරුව, කාර්යය මණ්ඩලය විසින් තවත් සංශෝධන හඳුනාගත් අතර සංශෝධිත ක්‍රියා පටිපාටි අත්පොත මණ්ඩලය විසින් 2019 අගෝස්තු මස 27 දින අනුමත කර ඇත | අධ්‍යක්ෂ ජනරාල් | මණ්ඩලයේ අනුමැතිය සහිත ක්‍රියා පටිපාටි අත්පොත 2019 සැප්තැම්බර් මස 19 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. | අනුකූලතාවය දක්වා ඇත |
| (ඉ) 2018 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොමැත | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විගණකවරුනට ඉදිරිපත් කලද එය ඒකාබද්ධ ආකෘතියකින් නොවීය. | අධ්‍යක්ෂ ජනරාල් | ඒකාබද්ධ පදනමක් මත 2020 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරෙමින් පවතී | ඒකාබද්ධ පදනමක් මත 2020 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරෙමින් පවතී |

# විගණකාධිපති වාර්තාවේ යොමුකර ඇති ගැටළුවල වර්තමාන තත්වය

| ගැටළුව | විස්තර සටහන | ක්‍රියාව භාර තැනැත්තා | ගන්නා ලද ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| **වෙනත් කරුණු** | | | | |
| 2017 ජුලි මස 01 වන දින සිට රු. 4,149,492/- ක කුලියක් ගෙවමින් පලමු මහල කුලියට ගැනීම සහ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීම | ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු තැබීමේ ලියවිලි 2019 අගෝස්තු මස 22 දින අනුමත කර ඇත.<br>මිලගණන් කැඳවීම සඳහා ප්‍රචාරණ දැන්වීම් 2019 සැප්තැම්බර් මස 01 දින ප්‍රසිද්ධ කිරීමට නියමිතය. | අධ්‍යක්ෂ ජනරාල් | ලංසු කැඳවීම සඳහා ප්‍රචාරණ දැන්වීම් 2019 සැප්තැම්බර් මස 01 දින ප්‍රසිද්ධ කරන ලදි | ලංසු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් අගය කෙරෙමින් පවතී |
| ICTA ආයතනය විසින් කළමණාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කර නැත | ගිවිසුමෙන් ඉවත්වීමට ගත් ICTA ආයතනයේ අභ්‍යන්තර තීරණයක් හේතුවෙන් ICTA ආයතනයට සේවා සැපයීමට නොහැකි විය. | අධ්‍යක්ෂ ජනරාල් | කළමණාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාවලිය සඳහා උපදේශකවරයෙකු යොදාගැනීමට මණ්ඩලයේ තොරතුරු තාක්‍ෂණ මෙහෙයුම් කමිටුව තීරණය කර ඇත | උපදේශකවරයෙකු යොදාගැනීමට අභිලාශය ප්‍රකාශ කිරීම ඇරයුම් කරමින් පුවත්පත් වල ප්‍රචාරණය කර ඇත |
| **කාර්යය සාධනය** | | | | |
| නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හඳුනාගැනීමට යාන්ත්‍රණයක් නොමැතිවීම | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ඇති අවශ්‍යතාවය පිලිබඳ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ගේ කළමණාකරණයේ අවධානය ඇඳගැනීමට ප්‍රචාරණ දැන්වීම් වාර්ෂිකව පුවත්පත් වල ප්‍රසිද්ධ කරනු ලැබේ. | අධ්‍යක්ෂ ජනරාල් | නියාමනයට ලක්වන අස්ථිත්ව ලැයිස්තු ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ දත්ත පදනම සමග සුපරීක්ෂාකාරීව සමාලෝචනය කෙරේ. | දැනට පවත්නා රාමුව තුල නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ගේ කළමණාකරණයට අනතුරු ඇඟවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 2019 පෙබරවාරි 26 දින විගණකාධිපති වරයා ඉල්ලූ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමට අදල තොරතුරු සැපයීමට මණ්ඩලය පෞද්ගලික පාර්ශවයක් සමඟ ගිවිසුමකට ඇතුලත් විය. සමහර තොරතුරු මණ්ඩලයේ නොමැති බව එම ක්‍රියාදමයේදී සොයා ගැණින. | ස්වයංක්‍රීය පද්ධතියක් නොතිබීම හේතුවෙන් එකී තොරතුරු ලබාගත නොහැකි වූ අතර අදල දත්ත පරිමාව විශාලය. එම නිසා මෙය වෙනම කාර්යය පැවරුමක් ලෙසට අපගේ අභ්‍යන්තර විගණනක වරුන්ට දෙන ලදි. බැහැරින් ලබාගත් කණ්ඩායමට සහායවීමට අපගේ තාක්‍ෂණික කාර්යය මණ්ඩලයට කාලය නොමැතිවීම නිසා ආයාසයකින් තොරව ලබාගත හැකි ආකාරයෙන් ඔවුනට සමහර තොරතුරු සොයාගත නොහැකි විය.<br>කෙසේවුවද, මෙම තොරතුරු සමාලෝචනය කරන ලද තාක්‍ෂණික ලිපි ගොනු වල ඇතුලත්ව තිබේ. | අධ්‍යක්ෂ ජනරාල් | එකී තොරතුරු සමාලෝචනය කරන ලද තාක්‍ෂණික ලිපි ගොනු වලින් ලබාගත හැක. | එවැනි තොරතුරු ආයාසයකින් තොරව ලබාගත හැකි ආකාරයෙන් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කර සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරගෙන යයි. |

# විගණකාධිපති වාර්තාවේ යොමුකර ඇති ගැටළුවල වර්තමාන තත්වය

| ගැටළුව | විස්තර සටහන | ක්‍රියාව භාර තැනැත්තා | ගන්නා ලද ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| සමහර නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්ට සන්නිවේදනය කල සොයාගැනීම් වලට අදල පසු විපරම් ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නැත | නිරීක්ෂණ සන්නිවේදනය කරනුලැබූ විට නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ගෙන් සම්පූර්ණ කරනලද පසු විපරම් ආකෘති පත්‍රය ලබා නොගැනීම මෙම ප්‍රකාශයට හේතුවිය. අනුකූලතාවය වැඩිදියුණු කිරීමට පිළියෙල කරන අයට සහයවීම සඳහා මෙම ආකෘතිය සන්නිවේදනය කරන නිසා මෙම පසු විපරම් ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම නීතියෙන් අනිවාර්ය නැත. | අධ්‍යක්ෂ ජනරාල් | අනුකූලතාවය වැඩිදියුණු කිරීමට පිළියෙල කරන අයට සහයවීමට සන්නිවේදනය කරන නිසා මෙම පසු විපරම් ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම නීතියෙන් අනිවාර්ය නැත. | ක්‍රියාකිරීමක් අවශ්‍ය නැත. |
| **කාර්ය මණ්ඩල පරිපාලනය** | | | | |
| මණ්ඩලයේ පුරප්පාඩු 11 අතුරින් 8 ක් ජ්‍යෙෂ්ඨ තනතුරුය. | දැනට පවතින රාජ්‍ය වැටුප් මට්ටම් වලට අනුව වසර 20 කට අධික පලපුරුද්දක් සහිත තාක්ෂණික නිපුණතාව ඇති වරලත් ගණකාධිකාරී වරයකු ආකර්ෂණය කර ගැනීමට නොහැකි නිසා අධ්‍යක්ෂ ජනරාල් තනතුර පුරප්පාඩුව පවතී. මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අයැදීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්මේන්තුව නිර්දේශකර ඇත | මණ්ඩලය | මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අයැදීමට සිහි කැඳවීම 2019 අගෝස්තු 21 දින මුදල් අමාත්‍යාංශයට යවා ඇත. | මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන තෙක් සිටී |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 6 සහකාර අධ්‍යක්ෂ නීති තනතුරු 1 - බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය කළමණාකරණ සේවා දෙපාර්මේන්තුව විසින් අනුමත කර නැත | අධ්‍යක්ෂ ජනරාල් | සිහි කැඳවීම සහ සාධාරණීකරණය 2019 අගෝස්තු 21 සහ 2019 අගෝස්තු 30 දිනවල යවා ඇත. | කළමණාකරණ සේවා දෙපාර්මේන්තුවෙන් අනුමත කරනලද බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය ලැබෙන තෙක් සිටී |
| ස්ථිර පිරිස් මණ්ඩල තනතුරු 04 ක් කොන්ත්‍රාක් පදනම මත පුරවා ඇත | තාක්ෂණික නිපුණතාව ඇති වරලත් ගණකාධිකාරී වරුන් ආකර්ෂණය කර ගැනීමට නොහැකි නිසා කොන්ත්‍රාක් පදනම මත පත්කිරීම් 2007 සහ 2009 දී කළමණාකරණ සේවා දෙපාර්මේන්තුව විසින් දෙන ලද අනුමැතියන් හා අනුකූලව සිදුකර ඇත. | මණ්ඩලය | අනුකූලතාවය නොදැක්වීමක් නොවේ | ක්‍රියා කිරීමක් අවශ්‍ය නැත |

# විගණකාධිපති වාර්තාවේ යොමුකර ඇති ගැටළුවල වර්තමාන තත්වය

| ගැටළුව | විස්තර සටහන | ක්‍රියාව භාර තැනැත්තා | ගන්නා ලද ක්‍රියාමාර්ග | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| කොන්ත්‍රාක් පදනම මත බඳවාගත් තනතුරු 02 ක කට ඉහළ පාරිශ්‍රමිකයක් හා ප්‍රතිලාභ ගෙවා ඇත | 2007 සහ 2009 දී කළමණාකරණ සේවා දෙපාර්මේන්තුව විසින් දෙන ලද අනුමැතියන් හා අනුකූලව අධ්‍යක්‍ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරු කොන්ත්‍රාත් පදනම මත පුරවන ලදි. බඳවාගැනීම කරන ලද්දේ හුදෙක් අවශ්‍ය කරන වර්ෂ ගණනක පලපුරුද්දක් සහිත තාක්‍ෂණික නිපුණතාව ඇති වරලත් ගණකාධිකාරී වරුන් ආකර්ෂණය කර ගැනීමට නොහැකි නිසයි. | මණ්ඩලය | 2007 සහ 2009 දී කළමණාකරණ සේවා දෙපාර්මේන්තුව විසින් දෙන ලද අනුමැතියන් හා අනුකූලව අධ්‍යක්‍ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරු කොන්ත්‍රාක් පදනම මත පුරවන ලදි. | අනුකූලතාවය නොදැක්වීමක් නොවේ |

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ ඇති නීතිරීති ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු.
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්.
- කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරත වී සිටින සමාගම්.
- ණය එකතුකිරීමේ සමාගම්.
- මූල්‍ය සමාගම්.
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලය පැවරූ සමාගම්.
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් සමාගම්.
- අරමුදල් කළමනාකරණ සමාගම්.
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියාත්මකවීමට බලයලත් සමාගම්.
- කොටස් වෙළඳපලේ ලැයිස්තුගත සමාගම්.
- අනෙකුත් සමාගම්

  (අ) රුපියල් මිලියන 500 කට වැඩි පිරිවැටුමක් ඇති සමාගම්;

  (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට අධිකව තිබූ සමාගම්;

  (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී දළ වත්කම් රුපියල් මිලියන 300 කට අධිකව තිබූ සමාගම්;

  (ඈ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වැඩි බැරකම් පැවති සමාගම්;

  (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් සංඛ්‍යාව 1,000 කට අධික සමාගම්;

- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා.
- ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා සමාගම් සමූහය යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

**ආයතනයේ නම**
ශ්‍රී ලංකා ගිණුම් හා
විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්වය**
1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා
විගණන ප්‍රමිත පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත
මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**
ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**
තෙවන මහල
293, ගාලු පාර,
කොළඹ 3
දුරකථන අංකයඃ 011 2301210
ෆැක්ස්ඃ 011 2301211
විද්‍යුත් තැපෑලඃ slaasmb@sltnet.lk

**වෙබ් අඩවිය**
www.slaasmb.gov.lk

**විගණකවරුන්**

**ව්‍යවස්ථාපිත විගණකවරුන්**
**විගණකාධිපති**
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

**අභ්‍යන්තර විගණකවරුන්**
බේකර් ටිලි එදිරිසිංහ සහ සමාගම
නො. 45, බ්‍රේබෲක් මාවත
කොළඹ 2

**බැංකුකරු**
ලංකා බැංකුව

**නීති උපදේශකවරු**
නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12